

# දුලා ගිය ගමන

දුල්නෙත් සෙතික ජයසූරිය

# දූලා ගිය ගමන

දුල්නෙත් සෙතික ජයසූරිය

ISBN-978-624-208-537-1

කෘතිය පල කල දිනය:
2025.02.08

කතෘගේ වෙනත් කෘති

"දූලා"

මහනුවර කිංස්වුඩ් විදුහල

7 ශ්‍රේණිය B

# පිදුම

ආදරණීය  අම්මාට.. තාත්තාට..

පොතක් කියවන්නට මා නිරන්තරයෙන්

උනන්දු කරවන ..

අමිතා රබ්බිඩිගල ගුරුතුමියට...

මුලින් ම පොතක් ලියන්න මා උනන්දු කළ

ජීවනී වත්තගේ ගුරුතුමියට...

සියලු අඩුපාඩු පෙන්වා දෙමින් මේ පොත

රසවත් ලෙස ලියන්නට මට උදව් කළ

සමන්මලි  ගුරුතුමියට..

ආදරණීය ඔබ සැමට...

ආදරයෙන් පුදමි..

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරුඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# හැඳින්වීම

ශ්‍රී ලංකාව යනු ඉතා කුඩා දූපතකි.නමුත් ශ්‍රී ලංකාව තුළ අප නොදුටු බොහෝ වටිනා තැන් ඇත.ඒවා ඉතා සුන්දරය.ඒවා තුළින් අපට බොහෝ දේ ඉගෙන ගැනීමට පුළුවන.. "දුලා ගිය ගමන" තුළ ලියවෙන්නේ එවැනි තැන් සොයා මා ගිය ගමන් තුළ ජීවිතයේ මට අමතක නොවන ඉතා සුන්දර අත්දැකීමකි....



දුල්නෙත් සෙතික ජයසූරිය

# ස්තූතිය..

"දුලා ගිය ගමන"

රසවත් කිරීමට..

හරවත් කිරීමට..

මා හට උදව් කළ සියලු දෙනාට

ස්තූතියි...


දුල්නෙත් සෙතික ජයසූරිය

# දුලා ගිය ගමන...

සතියේ දවස් පහේම ඉස්කෝලෙ ගිහින් ඔන්න ඉතින් සෙනසුරාදා ඉරිදා පොඩි නිවාඩුවක් ලැබෙනවා....ඒත් ගෙදර ඉන්නවා කියන එක නම් හරිම කම්මැලි වැඩක්...

ගාෆිල්ඩ්, චූටි ,ඩොටි ගෙදර ඉන්න මගේ මේ පුංචි යාලුවෝත් මං එක්කම දැන් ටිකක් ලොකු වෙලා....ඉස්සර වගේ නෙමෙයි දැන් එයාලා සෙල්ලමට ටිකක් හොරයි...ඉතින් දැන් ඒ වෙනුවට අපේ තාත්තා මට තව අලුත් යාලුවෙක් ගෙනත් දුන්නා..එයාගේ නම රෙක්ස්...එයා හරිම හුරතල් බලු පැටියෙක්...

රෙක්ස් ගෙදරට ආව එක ගැන මගේ පූස් යාළුවන්ගේ නම් ලොකු කැමැත්තක් නෑ...හැබැයි ඉතින් මෙයාලගේ එක එක විදිහේ හැසිරීම් ගැන මම ගෙදර ඉන්න ගමන් හරිම ආසාවෙන් තමයි බලාගෙන ඉන්නේ...




මං දැන් ඉන්නේ හත වසර...ඉස්සර වගේ නෙමෙයි ඉස්කෝලෙ ගියත් ඉගෙන ගන්න දේවල් ගොඩක් තියෙනවා..හැබැයි ඉතින් ලොකු ලොකු පොත් වල තියෙන දේවල් කට පාඩම් කරගෙන විභාග ලියන්න නම් මගේ ලොකු කැමැත්තක් නෑ...

ඒ උනාට මං ඉස්කෝලෙ යන්න නම් හරිම ආසයි...ඉස්කෝලේ මට ගොඩක් යාලුවෝ ඉන්නවා.එයාල එක්ක හරිම සතුටින් තමයි මගේ දවස ගෙවිලා යන්නේ...ගුරුවරුත් ඒ වගේමයි...සමහර වෙලාවට පුංචි පුංචි දඬුවම්වලට මුහුණ දෙන්න වුනත් ඉස්කෝලේ යන්න මං හරිම ආසයි...




හැමදාම වගේ ඉතින් ඉස්කෝලෙන් පස්සේ මොනවා හරි බාහිර වැඩක් යෙදෙනවා...ඉස්කෝලෙ මාධ්‍ය සංසදයේ පුහුණුවක්...නැත්නම් ක්‍රීඩා පුහුණුවීමක්..එහෙමත් නැත්නම් නැටුම් පුහුණුවක්..සංගීත අංශයේ වැඩක්... ඔය වගේ මොනවා හරි දෙයක්...

හැබැයි ඉතින් ඒකට නම් මම හරිම ආසයි...ඇත්තටම යාළුවොත් එක්ක වැඩක් කරනකොට එතන වෙලාව යනවා දැනෙන්නේ නැහැ...අපි හැමෝම එකතුවෙලා හවසට මොන මොනවා හරි කාලා තමයි ඉතින් වැඩ පටන් ගන්නේ...ඉතින් ඔන්න ඔය විදිහට සතිය දවස් පහ ගෙවිලා යනවා දැනෙන්නෙවත් නැතිව හරිම ඉක්මනට.....



මගේ අම්මයි තාත්තයි වගේම මමත් හරිම ආසයි ඇවිදින්න...නිවාඩුවක් ලැබුන ගමන් අපි කරන්නේ කොහේ හරි යන එක..ගොඩක් වෙලාවට අපි නොගිය තැන් හොයාගෙන යන්න අපි හරිම ආසයි...කොහේ ගියත් දවසක් දෙකක් නැවතිලා ඉඳලා තමයි අපි ආයෙමත් එන්නේ....ගොඩක් වෙලාවට අම්මයි තාත්තයි මමයි තමයි මේ විදිහට යන්නේ...ගොඩක් දුරක යන තැන්වලදි නම් අපේ අත්තම්මවත් අපි එක් කරගෙන යනවා...

කෑම බීම හදාගෙන අපි මේ යන ගමන් හරිම විනෝදයි...සමහර තැන්වලදී අපිට උන දේවල් මතක් වෙනකොට මට තනියමත් හිනා යනවා.




අපි මේ යන හැම තැනකම ඉගෙන ගන්න දේවල්.. දැනගන්න දේවල්.. ගොඩක් තියෙනවා..අපි දැකල නැති දේවල් වගේම අපිට ගොඩක් මිනිස්සුන්ව අඳුරගන්න එයාලත් එක්ක කතා කරන්න එයාලගෙන් දේවල් ඉගෙන ගන්න පුළුවන් වෙනවා...

ඒ විදිහට මම ගියපු ගමන් වලින් මං ආසම කරන ගමන තමයි මාදු ගඟේ ගමන..අලුත් අවුරුදු නිවාඩුවට තමයි අපි මේ ගමන ගියේ..මේ ගමන යන්න අපේ ලොකු අම්මලා, අත්තම්මලා, මේ හැමෝම අපිත් එක්ක ආවා...අපේ රටේ දකුණු පළාත...එහෙම නැත්නම් අපි ගොඩක් ආස කරන මුහුද තියෙන පැත්තට තමයි අපි ගියේ....මේ ගමන මට වෙනස්ම අත්දැකීමක් වුණා....



හැමදාම වාහනේක නැගලා පාරක් දිගේ යන මට...බෝට්ටුවක නැගලා ගඟක් දිගේ යන අත්දැකීම කවදාවත් අමතක නොවෙන වෙනස්ම අත්දැකීමක් වුණා..ඇත්තට ඒක නම් මට කවදාවත් අමතක වෙන්නේ නැතිවෙයි .

මාදු ගඟ හරිම ලොකුයි.මුලදි නම් පුංචි බයකුත් දැනුනා.කිඹුලෙක්වත් ඉඳීද කියලා...ඒත් අපේ පවුලේ හැමෝම හරිම ආරක්ෂාකාරී විදිහට කොහොමද බෝට්ටුවේ යන්න ඕනේ කියලා බෝට්ටුවට නඟින්න කලින් එතන ඉන්න මාමලා අපිට උපදෙස් දුන්නා.මට තාමත් මතකයි අපිව බෝට්ටුවෙන් එක්කන් ගිය සීයා හරිම හොඳයි.එයා අපි නොදන්න දේවල් ගොඩක් ගැන කියා දෙන ගමන් අපිව හරි පරිස්සමට බෝට්ටුවෙන් ගොඩක් තැන් වලට එක්කගෙන ගියා.



මාදූ ගඟ දිගේ යනකොට තැනින් තැන දූප්පත් ගොඩක් දැක ගන්න පුළුවන් .ලොකු දූපත් ..පොඩි දූපත්..මේ දූපත්වලට වෙන වෙනම නමුත් තිබුණා.නයි දූපත... සත පහේ දූපත..මේ නම් හැදෙන්න හේතුවුන හරි ලස්සන කතන්දරත් බෝට්ටුවේ යන ගමන් සීය අපිට කියලා දුන්නා.මිනිස්සු ජීවත්වන එක දූපතකුත් තිබුණා.කුරුඳු හදන දූපතක්...ඒ වගේම හරිම ලස්සන පන්සල් කීපයක් තියෙන දූපත් කීපයකුත් සීය අපිට පෙන්නුවා...පෙන්නුවා විතරක් නෙමෙයි අපි සමහර දූපත්වලට බැහැල ඒ දූපත්වල ඇවිදලත් බැලුවා...ඇත්තටම ඒක හරි ලස්සන අත්දැකීමක්...

දිග පාලම් යටින් අපි බෝට්ටුවෙන් ගියා.ලස්සන ලස්සන මාළු එකතු කරලා හදපු **fish therapy** එකකටත් අපි ගියා.ඒකනං හරි අමුතු අත්දැකීමක්...ඒ මාළුවො ඇවිත් අපේ කකුල් වලට කොටන කොට කකුල් කිති කැවෙනවා...එතන ඉන්න මාමලා නම් කිව්වේ ඒක අපේ ශරීරයට ගොඩක් හොඳ සම්බාහන ක්‍රමයක් කියලා...ඒ කොහොම වුනත් මට නං ඒක හරිම විනෝද ජනක අත්දැකීමක් වුණා.ඒ අතරේ මං ජෙල් මාළුවොත් දැක්කා.

මාදු ගඟ දිගේ බෝට්ටුවේ යන අපිට තව අලුත් අත්දැකීමක් විඳගන්නට ලැබුණා.ඒ තමයි ගඟ මැද තියෙන පුංචි කඩයක්.ඒ කඩේ පොඩි පොඩි කෑම වර්ග ගොඩක් තිබුණා.ඒ කඩේ විශේෂත්වය වුණේ එතන තියෙනවා අපි කවදාවත් බීලා නැති රස බීම ජාතියක් .ඒ තමයි කිරල බීම...බෝට්ටුවේ ගිය අපි හැමෝම කිරල බීම බිව්වා.බෝට්ටුවේ ගිය සීයා කිරල බීම හදන හැටි ගැනත් අපිට කියලා දුන්නා.ඒ වගේම කිරල ගෙඩිත් අපිට පෙන්නුවා.ඒව දකුණු පළාතේ තියෙන පලතුරු ජාතියක්ලු.හරිම රස බීමක්.ඒ වගේම එයාලා නම් කියන්නේ ඒ බීම එක හරිම වටිනා ඖෂධීය පානයක් කියලා.



මාදු ගඟ දිගේ ඉස්සරහට යනකොට කඩොලාන ශාක ගොඩක් දැක ගන්න පුළුවන්.සමහර තැන්වලදී අපි කඩොලාන පඳුරු අස්සෙන් තමයි යන්න ඕනේ...ඒක හරිම වෙනස්ම විදිහේ අත්දැකීමක්..

මම අහල තියෙනවා..කඩොලාන ශාක පරිසරයට සහ විවිධ සතුන්ට විශාල ආරක්ෂාවක් ලබාදෙන ශාක විශේෂයක් කියලා.ඉතින් ඒ කඩොලාන පඳුරු අතරින් යන අතරේ ඇඟට දැනෙන්නේ හරිම අමුතු සිසිලසක්...


ඒ අතරේ තවත් දෙයක් මතක් කරන්නම ඕනේ...සමහර තැන්වලදී මම දැක්කා ප්ලාස්ටික් බෝතල්..අයිස්ක්‍රීම් කොළ...යෝගට් කෝප්ප...මේ පඳුරු අතරේ එකතු වෙලා..හිරවෙලා..තියෙනවා.ස්වභාව සෞන්දර්ය අපට මේ තරම් වටින දේවල් ..ලස්සන දේවල් දායාද කරනකොට...අපි මේ වගේ දේවල් කරන්න හොඳ නෑ නේද...?..කියල මට හිතුනා..අපි හැම වෙලාවෙම අපේ පරිසරයට ආදරය කරන්න ඕනේ...

බෝට්ටුවක ගඟක් දිගේ වෙනස්ම පරිසරයක් දිහා බලාගෙන යනකොට හරි ලස්සන කුරුල්ලෝ කීපදෙනෙකුත් අපේ ගමනට එකතු වුණා..එයාලා අපේ බෝට්ටුව ළඟින් අපිත් එක්කම පියාඹගෙන ගියා.ඇත්තටම මේ ගමන හරිම විනෝදයි.

ලංකාවේ අපි විතරක් නෙමෙයි.මම දැක්කා ගොඩක් විදෙස් ජාතිකයින් අපේ රටේ මේ ලස්සන බලන්න ඇවිත් ඉන්නවා.

එයාලා හරිම ආසාවෙන් පුදුමෙන්,අපේ රටේ දේවල් ගැන අහගෙන බලාගෙන ඉන්නවා.ඇත්තටම ඒ වෙලාවෙදිනම් මට මගේ රට ගැන හරිම ආඩම්බරයක් දැනුනා.මෙයාල මේ ලස්සන බලන්නේ ..පින්තූර ගන්නේ මගේ රටේ නේද කියලා මට හිතුනා.

ඉතින් ඔන්න ඔය විදිහට මාදු ගඟ දිගේ හෙමින් හෙමින් ගොඩක් දේවල් බලන ගමන් බෝට්ටුවේ සීයා අපිව අන්තිමට එක්කගෙන ආවෙ හරි ලස්සන තැනකට.පින්තූරවල වීඩියෝ පටවල දැකලා තිබුණට මෙතන මම ඇත්තටම දැකලා තිබුණේ නැහැ ගඟක් මුහුදට වැටෙන තැන..ගං මෝය...අපි ඒ කිට්ටුවටම බෝට්ටුවෙන් ගියා...ඇතින් විශාල මුහුද අපිට පේනවා...මේ පැත්තෙ ගඟ...ඇත්තටම ඒක මට හරි අපූරු අත්දැකීමක් වුණා.





ඉතින් ඔන්න ඔය විදිහට බෝට්ටුවේ සීයා අපිව පරෙස්සමට ගොඩබිමට එක්කරගෙන ආවා..

.ගඟ දිගේ ගිය ගමන ගොඩක් වෙනස් .....මෙච්චර කාලයක් නොදැක්ක දේවල් ගොඩක් දැකගන්න ලැබුණා..හරි ලස්සන ජනකතා ඇහුවා...විවිධ සත්තු...බෙහෙත් පැළෑටි වර්ග...බීම වර්ග...මිනිස්සු..එයාලගේ භාෂාව....මේ වගේ වෙනස්ම විදියේ අත්දැකීම් ගොඩක් මේ ගමනෙදි මට ලැබුණා...පොතක් කියවල ඉගෙන ගන්නවට වඩා...ගොඩක් දේවල් කවදාවත් අමතක නොවෙන විදිහට රසවත්තව ඉගෙනගන්න ලැබුණා...

සීයට ස්තූති කරලා එන ගමනේ...මාදූ ගඟේ අපේ අත්දැකීම් ගැන අපි ගොඩක් දේවල් කතා කරා..


අලුත් දේවල් දකින්න..අලුත් දේවල් අහන්න...මං වගේම පුංචි මගේ යාළුවෝ හුඟක් ආසයි කියලා මං දන්නවා...

ශ්‍රී ලංකාව කියලා කියන්නේ හරිම ලස්සන රටක්...ලස්සන තැන් ලස්සන දේවල් ගොඩක් තියෙනවා අපිට බලන්න...ඉගෙන ගන්න...අපේ මේ පරිසරය...අපිට අපේ ජීවිතයට ගොඩක් දේවල් කියලා දෙනවා....

ඊළඟ දවසේ ඉස්කෝලෙ සාහිත්‍ය සමිතියේ කතා කරන්න දැන් මට ලස්සන මාතෘකාවක් තියෙනවා....මං හිතනවා හැමෝම මගේ කතාව ආසාවෙන් අහගෙන ඉදියි කියලා.....

පුංචි ඔයාලත් හැමදාම අලුත් වෙන්න..අලුත් විදිහට හිතන්න...වෙනස් වෙන්න....තමන්ට වගේම පරිසරයේ දේවල් වලටත් ආදරය කරන්න..





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්